ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශාස්ත්‍රවේදී පළමු වන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/අගෝස්තු
ආර්ථික විද්‍යාව

# ECON 1110.03/1110/1101 – සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම

කාලය පැය තුන (03) යි.

**ප්‍රශ්න පහ (05)කට පමණක් පිළිතුරු සපයන්න.**

1. පහත සංකල්ප අතර වෙනස්කම් පහදන්න.

i). වුවමනා සහ ඉල්ලුම

ii). නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ බෙදාහැරීමේ කාර්යක්ෂමතාව

iii). යථානුරූපී සහ අභිමතානුරූපී ප්‍රකාශන

iv). හිඟකම සහ ආවස්ථික පිරිවැය

(එක් කොටසකට ලකුණු 04)

2. i). ආර්ථික පද්ධති නම් කර ඒවායේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 08)

ii). නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 08)

3. මෝටර් රථ හා කිරි යන භාණ්ඩ දෙවර්ගය පමණක් නිපදවන සරල ආර්ථිකයක් සැලකිල්ලට ගනිමු. මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිමට අදාළ නිෂ්පාදන සංයෝග කිහිපයක් පහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

| මෝටර් රථ නිෂ්පාදනය (දහස්වලින්/වසරකට) | කිරි නිෂ්පාදනය (ලීටර්වලින්/වසරකට) |
|---|---|
| 0 | 60 |
| 1 | 50 |
| 2 | 30 |
| 3 | 0 |

i). මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය අඳින්න. (ලකුණු 02)

ii). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයි? (ලකුණු 02)

iii). දැනට මෙම ආර්ථිකය මෝටර් රථ 2000ක් සහ කිරි ලීටර් 30000ක් නිෂ්පාදනය කරන බව සිතන්න. අමතර කිරි ලීටර් 20000ක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ ද?
(ලකුණු 02)

iv). කාර් ඒකක 2000ක් සහ කිරි ලීටර් 50000ක් නිපදවීමට මෙම ආර්ථිකය සැලසුම් කරන්නේ යැයි සිතන්න. එම නිපැයුම ළඟා කර ගැනීමට ආර්ථිකයෙහි සිදුවිය යුතු වෙනස්කම් රූපසටහන ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

v). වැඩෙන ආවස්ථික පිරිවැය හා හීනවන ආවස්ථික පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 05)

4. i). ඉල්ලුම් නීතිය පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii). පසුගිය දශක දෙක පුරාවට විශ්වවිද්‍යාලයක අධ්‍යාපන ගාස්තු 50%න් ඉහළ ගියේය. ඒ අතරම ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව ද 22000 සිට 35000 දක්වා වැඩි වී ඇත. මෙම උදාහරණය මගින් ඉල්ලුම් නීතිය බිඳවැටෙන බව පෙන්නුම් කරයි ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii). ආර්ථික තීරණ ගැනීම කෙරෙහි මිල ඉල්ලුම් නම්‍යතාව වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv). සිනමා ශාලාවක් තුළ බොහෝ ආසන හිස්ව පවතී. කළමනාකරු පහත සඳහන් විකල්පයන් සළකා බලයි.

- 12% මිල අඩු කිරීම - 18% ඇතුළුකිරීම් වැඩි වීම
- 10% මිල වැඩි කිරීම - 12% ඇතුළුකිරීම් අඩු වීම

පිරිවැටුම උපරිම කිරීමට කළමනාකරු මින් කුමන විකල්පය තෝරාගනු ලබන්නේ ද? (ලකුණු 06)

5. i). සැපයුම් නීතිය පැහැදිලි කර සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වීමට හේතු දක්වන්න. (ලකුණු 04)

ii). සැපයුම් තීරක මොනවාද? (ලකුණු 03)

iii). මෙම එක් එක් තීරකවල වෙනස්වීම් සිදුවන විට සැපයුම් වක්‍රයට කුමක් වේද? (ලකුණු 03)

iv). ලක්ෂ්‍ය සැපයුම් නම්‍යතාව සහ චාප සැපයුම් නම්‍යතාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

v). සැපයුම් නම්‍යතාව තීරණය කරන සාධක මොනවාද? (ලකුණු 02)

6. පහත සිදුවීම් තරඟකාරී වෙළෙඳපොළක සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි බලපානු ලබන්නේ කෙසේද? වෙන වෙන ම ප්‍රස්තාර සටහන් යොදාගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

i). පාරිභෝගික ආදායමේ පහත වැටීමක්

ii). නීතිමය සේවාවන් කෙරෙහි බලපාන ආකාරයෙන් නීති විද්‍යාල උපාධිධාරීන්ගේ සංඛ්‍යාව පහළයාමක්

iii). වෛද්‍ය සේවාවන් කෙරෙහි බලපාන ආකාරයෙන් ජනගහනය තුළ වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය ඉහළයාමක්

iv). පිරිවැය අවම කිරීමේ තාක්ෂණික නවෝත්පාදන

(එක් කොටසකට ලකුණු 04)

7. දී ඇති ප්‍රස්තාර සටහන භාවිතයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i). ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා විවෘත නොවූ බදු රහිත නිදහස් වෙළෙඳපොළක් පිළිබඳව සිතන්න. පහත සඳහන් ප්‍රදේශ පෙන්නුම් කරන අක්ෂර නම් කරන්න.

a. පාරිභෝගික අතිරික්තය

b. නිෂ්පාදන අතිරික්තය

(ලකුණු 04)

ii). ආණ්ඩුව නිෂ්පාදකයා මත ඒකකයකට රු. 5ක අලෙවි බද්දක් පැනවූයේ නම් පහත සඳහන් ප්‍රදේශ පෙන්නුම් කරන අක්ෂර නම් කරන්න.

a. පාරිභෝගික අතිරික්තය

b. නිෂ්පාදන අතිරික්තය

c. බදු ආදායම

d. සුබසාධන ප්‍රතිවිපාකය

(ලකුණු 08)

iii). ආණ්ඩුව රු. 3ක උපරිම මිල සීමාවක් හඳුන්වා දෙන්නේ නම් පහත සඳහන් ප්‍රදේශ පෙන්නුම් කරන අක්ෂර නම් කරන්න.

a. පාරිභෝගික අතිරික්තය

b. නිෂ්පාදන අතිරික්තය

c. සුබසාධන ප්‍රතිවිපාකය

(ලකුණු 04)

************